

# අවුරුදු අසිරිය

එරබඳු මල් පිපිලා මුළු ගමම සුවඳවත් වෙනවා. කොහා කොහේදෝ ඉඳන් කෑ ගහන සද්දෙට මුළු ගම්මානයම අමුතුම ප්‍රබෝධයකින් වාගේ ලඟ එන අළුත් අවුරුද්දට ලක ලෑස්ති වෙනවා. වරින් වර ඇහෙන රබන් පද මුළු ගමටම ආශීර්වාදයක් වගේ. ඒ විතරක් නෙවේ කජු ගස්වල රතුපාටට කජු පුලන් පිරිලා වවුලන්ගෙන් බේරෙන්න බෑ. හැම ගහකම වැලකම පරණ කොල ඔක්කොම වැටිලා ගිහිල්ලා අළුත් දළු කොල දාලා මුළු පරිසරයම ලස්සන වෙලා. මුළු පරිසරයමත් අවුරුද්දට කලින්ම සූදානම් වෙලා වගෙයි පේන්නේ.

කුඹුරුවල වැඩ ඉවර කරලා, අස්වැන්න නෙලා ගන්න ගම්වැසියෝ ලඟි ලඟියේ සූදානම් වෙන්නේ බක්මහ මංගල්ලෙට. අවුරුදු ලං වෙනකොට ගමේ පිරිමි අයට වගේම ගෑණු අයටත් බරටම වැඩ තියෙනවා. සමහරු කැවුම් කොකිස් අග්ගලා වගේ අවුරුදු කෑම ජාති හදනවා. සමහර අය ගෙවල් සුද්ධ පවිත්‍ර කරන්න ලක ලෑස්ති වෙනවා. ගමේ වයසක ගෑණු අය කලින්ම කරන්නේ අළුත් වලන් ගෙනැල්ලා පරෙස්සමට තියෙන එකයි. පිරිමි අයටත් මේ වෙනකොට තදේටම වැඩ කටයුතු තියෙනවා. කෙසෙල්කන් කපලා ඉදෙන්න වල දානවා. ගෙවල් අළුත්වැඩියා කරනවා. වැඩ කරන ගෑණු අයට උදව් පදව් දෙනවා.

***විශේෂයෙන්ම එකි-නෙකා අතර හොඳ හිත පවත්වා ගැනීමට හා අනෙන්‍ය විශ්වාසය තබා ගැනීමට මේ අවුරුදු චාරිත්‍ර විධි මහෝපකාරී වේ.***

විශේෂයෙන්ම අවුරුද්දට මේ ඔක්කෝටම වඩා අවුරුදු ක්‍රීඩා සඳහා කලින්ම සුදානම්වීම ගමේ ප්‍රධාන කටයුත්තක්. පංච දැමීම, දාන් ඇදීම, චක්ගුඩු පැණීම වගේ ක්‍රීඩා මේ අතරින් මුල් තැනක් ගන්නවා. අවුරුද්දට දවස් කීපයකට කලින් අළුත් ඇඳුම් ගමේ හැම ළමයෙකුටම දෙමව්පියෝ ගෙනැත්දීම අවුරුද්දේ සිරිතක්. ළමයි ඇඟිලි ගනින්නේ කවදද ඒ දවස එන්නේ අළුත් ඇඳුම් ඇදගෙන ගමේ ඇවිදින්න යන්න. අවුරුද්දට කලින්ම රතිඤ්ඤා ලෑස්ති කරන එක ළමයින් ගේ අවුරුදු චාරිත්‍රයක් වගේ. අවුරුද්දට පාසල් නිවාඩුව ලැබුනහම ළමයින්ට පුදුම නිදහසක් ලැබෙන්නේ. මුළු ගමම එකම සැණකෙලියක සිරි උසුලනවා. වැඩි හරියක් ගෑණු ළමයි රබන් ගහන්න වගේම ඔන්චිලි පදින්නත් හරි කැමතියි. අවුරුද්දට නැතිවම බැරි අංගයක් තමා ඔන්චිල්ලාව. ඔංචිලි පදින කොට ගායනා කරන ඔන්චිලි වරම් ගමේ ගෑණු ළමයි ඔක්කෝටම වගේ කටපාඩම්. රබන් පද නම් හොඳටම කටපාඩම් තියෙන්නේ වයසක ගෑණු අයට.

අවුරුදු පෙර සූදානම වගේම අවුරුදු දවසේ වැදගත්ම අංගය වන්නේ පවුලේ සියල්ලන් එකතු වී පවත්වන චාරිත්‍රයි. ඒ අවුරුදු චාරිත්‍ර පටන් ගන්නේ අවුරුද්දකට කලින් පරණ අවුරුද්දේ ඉදලයි. ගසක පැවැත්ම එහි අරටුව මෙන් අවුරුද්දේ පැවැත්ම රදාපවතින්නේ මිනිසුන් අතර ඉමහත් භක්තියෙන් පවත්වන මේ චාරිත්‍ර විධි සමූහය බව පවසන්නේ නම් එය සත්‍යයකි. පවුලක් අතර නෑදැයන්, අසල්වැසියන් හා ගමේ අය අතර පවතින හොඳ හිත හා සුහද බව, සුරැකුනේ නම් මේ චාරිත්‍ර විධි මෙතෙක්, පවත්වගෙන ඒමේ ප්‍රථිඵලයක් නිසාවෙන්ය. ලිපගිණි මෙලවීම, අනුභවය, ගණුදෙනු කිරීම වැඩිහිටියන් පිදීම, ආගමික චාරිත්‍ර හා තෙල් නානු මංගල්‍යය යන සියල්ලම අවුරුදු දවසේ පවත්වන චාරිත්‍ර විධීන්ය.මානව ජාතියක පැවැත්ම සඳහා ඉතිරි වූ යමක් වේ නම් එය මේ චාරිත්‍රයන්මය. විශේෂයෙන්ම ඒවා ආගමික මනස හා බැඳුනක්ම විය.

අළුත් අවුරුද්ද, අවුරුදු ක්‍රීඩා චාරිත්‍ර හා බැඳුනද එය නැකත් හා සම්බන්ධතාවය ඉතාමත් ප්‍රබලය. එහි ප්‍රකාශිත අයුරු අවුරුද්ද යනු ''සූර්යා මුල්කොට පවතින බවත්, සූර්යා මීන රාශියේ සිට මේෂ රාශියට ගමන් කිරීම අවුරුද්ද යනුවෙනුත් දක්වා තිබීම වැදගත්ය. ආදිවාසීන්ගේ පැරණි විශ්වාසයක් වූයේ හිරු දෙවියෙක් ලෙස සලකා කටයුතු කිරීමයි. එක අතකින් සියලු චාරිත්‍ර රදා පවතින්නේ මේ නැතක් වේලාවන් අනුවයි. ඒ නිසා නැකත් හා අවුරුද්ද අතර ඉතා පැරණි සිට ඇත්තේ තද බැදීමක්ය. චාරිත්‍ර විධීන් සමඟ මේ බැඳීම සමාජ යහපත සඳහා හේතුවේ.

විශේෂයෙන්ම එකිනෙකා අතර හොඳ හිත පවත්වා ගැනීමට හා අනෙන්‍ය විශ්වාසය තබා ගැනීමට මේ අවුරුදු චාරිත්‍ර විධි මහෝපකාරී වේ. බොහෝ අය කැවිලි බඳුනක් හෝ පෙට්ටියක් නෑ හිත මිතුරන්ට තෑගි කිරීම උසස් වූ සම්බන්ධතාවයක් ගොඩනැගීම මෙහි මූලික පරමාර්ථය වේ. පෙර තිබූ අමනාපකම් ඉවත දමා මිතුදම් ගොඩනගා ගැනීමත්, තර කර ගැනීමත් මෙයින් සිදුවන අතුරු පලයකි. අවුරුද්ද හා බැඳුන ක්‍රීඩාද ඔවුන් අතර හොඳ හිත වර්ධනය බෙහෙවින් ඒ සඳහා ඉවහල් වේ. එපමණක් නොව මුළු අවුරුද්දක් පුරා දොලොස් මාසයක් ගෙවා එළඹෙන සුභ දිනයක සියලුදෙනා එක්ව එක් සිත්ව සතුටින් ප්‍රීතියෙන් කා බී සිත් ප්‍රබෝධවීම අවුරුද්දේ පරමාර්ථය වුවද එයින් අපේ ජාතියේ පැවැත්මේ අරටුවත් අනන්‍යතාවයත් මොනවට ප්‍රකාශිත වේ.

**මහින්ද දිසානායක - දිවුල්ගනේ**


සන්නස

දැන්වීම් සඳහා විමසන්න

03 9402 5380

0425 720 932





Our practice is based on three main principles; Fairness, Compassion and Deliver Results. We pledge our commitment to further enhance these principles in our service to you........

*Susantha Katugampala*

**SUSANTHA KATUGAMPALA**

LL B (Monash)

Barrister & Solicitor

Registered Migration Agent: 96/86306

Australian qualified and experienced Sri Lankan Lawyer

**FAIRFIELDS**

**IMMIGRATION LAWYERS - MELBOURNE**

10, Morrison Place, East Melbourne 3002

Telephone: 03 9650 4557 Fax: 03 9650 4559

Interstate Callers: 1300 888 331

Email: fairfields.lawyers@bigpond.com

We Deliver Results.....

Design / Waruna Savinda / 0402 894 942